**ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග සැසඳීමක් කළ නොහැක.

(ආ) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන අනුව වත්කම් ලේඛණය හා 2018 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කරන ලද වත්කම් ලේඛණය අනුව වත්කම් අයිතම 03 ක වටිනාකම් අතර තිබූ රු.10,226,463 ක වෙනස හඳුනා ගෙන සැසඳීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂයන්හි වෙනසට හේතු හඳුනා ගෙන සැසඳීමට කටයුතු කිරීම. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. ජංගම නොවන වත්කම් නව මිලදී ගැනීමක් හැර වෙනත් ආයතනයකින් එම වර්ෂය තුළ ලැබීමක් සටහන් කිරීමේදී එය ආරම්භක ශේෂයක් ලෙස සිගාස් වැඩසටහනේ සටහන් කරයි. එබැවින් සිගාස් වැඩසටහනේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂයත් ගිණුමේ 2018 ජනවාරි 01 දිනට ශේෂයත් අතර එවැනි වෙනසක් පෙන්නුම් කරයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය තුලදී රු.මිලියන 4071.68 ක අග්‍රිම ඉල්ලුම් කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර රු.මිලියන 89.91 ක් ඉල්ලුම් කර තිබුණි.නමුත් භාණ්ඩාගාරය විසින් රු.මිලියන 61.41 පමණක් නිකුත් කර තිබුණි. | අග්‍රිමය නිසි පරිදි සැලසුම් කිරීමත්,අග්‍රිම කළමනාකරණය ඵලදායි ලෙස සිදු කිරීමටත් කටයුතු කළ යුතු වීම. | රු.බි.4ක මුදල ප්‍රීමා ලංකා (පෞද්ගලික ) සමාගම සඳහා ගෙවීම සඳහා වෙන් වී ඇති අතර එම ආයතනය සමඟ මෙතෙක් ගිවිසුම් අත්සන් කොට නොමැති බැවින් මෙම මුදල ගෙවීමට නොහැකි විය. |

**2.2** ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ආදායම් සංකේතාංකය සහ ආදායම් සංකේතාංක විස්තරය- 10.02.10.00 - සමාජ වගකීම් බද්ද** | | |
| (අ) 2018 දෙසැම්බර් 31 දින වන විට උක්ත ආදායම් ගිණුමට අදාලව රු.64,802,267 ක මුදලක් හිඟව පැවති අතර මෙම ශේෂය තුල වසර 05 ඉක්මවූ රු.63,012,706 ක ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි 128 (ඉ) ප්‍රකාරව රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදවීම. | මෙම සමාජ වගකීම් බද්ද 2011 වර්ෂයේදී නවතන ලද බද්දක් වන අතර එහි ගෙවීමට ඇති හිඟ ආදායම් පමණක් මේ වනවිට එකතු කරමින් පවතී. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි 128 (ඉ) ප්‍රකාරව රාජ්‍ය ආදායම එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන් දීමේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සඳහා විධිවිධාන යෙදවූ බවට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | -එම- | මෙම හිඟ මුදලට අදාල උපලේඛනය සලකා බැලීමේදී සියලුම අගයන් ඉතා පැරණි ආයතනවලට අදාල අගයන් වන අතර රේගු දෙපාර්තමේන්තුව හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යන ආයතනයන් එම මුදල් එකතු කිරීමට කටයුතු කරමින් පවතී. |

**2.3 වියදම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මු.රෙ. 66 මාරු කිරීම් සඳහා අනුමැතිය ලැබීමට පෙර එක් වැය විෂයයකින් අදාල නොවන පරිදි විදේශ සංචාරයක් සඳහා අනියම් දීමනා ගෙවීම සඳහාත්, ගුවන් ගමන් බලපත්‍ර ගාස්තු ගෙවීම සඳහාත් රු.845,395 ක වියදම් දරා තිබුණි. | මු.රෙ. 66 මාරු කිරීම් සඳහා විධිමත් අනුමැතිය ලද පසු අදාල වැය විෂයයන්ගෙන් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වීම. | විදේශ ගමන් වියදම් වැය ශීර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් අයවැය දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර එම වියදම දරන අතර ඉන් පසුව මු.රෙ.66 මඟින් අවශ්‍ය අනුමැතිය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |
| (ආ) 2018 වර්ෂය තුල මු.රෙ .66-69 ප්‍රතිපාදන යටතේ පුනරාවර්තන වැය විෂයයන් 03ක ප්‍රතිපාදන සියයට 02 සිට 30 දක්වා අඩු කිරීම් ද, වැය විෂයයන් 05 ක ප්‍රතිපාදන සියයට 07 සිට 146 දක්වා වැඩි කිරීම් ද සිදු කර තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවීම. | එක් එක් වැය විෂයන් සඳහා අමතර ප්‍රතිපාදන අවශ්‍යතාවය හා ඉතිරිවීම් සලකා බලා ප්‍රතිපාදන මාරු කිරීම් සිදුකර ඇත. |
| (ඇ) 2018 වර්ෂයෙහි සමස්ථ පුනරාවර්තන වියදම් සඳහා රු.බිලියන4.08 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද ඉන් ප්‍රතිපාදන ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 99 ක් වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. |
| (ඈ) පුනරාවර්තන ප්‍රතිපාදන තුල ප්‍රීමා ලංකා (පෞද්ගලික) සමාගමට ගෙවිය යුතු රු.බිලියන 4 ද ඇතුලත් වුවද එම ආයතනය සමග වූ බේරුම්කරණ ගැටළුව 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිරාකරණය වී | අදාල ගැටළුව කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ජාත්‍යන්තර බේරුම්කරණයේ දී ප්‍රීමා ලංකා (පෞද්ගලික ) සමාගම සඳහා ඇ.එ.ජ. ඩොලර් මිලියන 55 ක් ගෙවීමට, රජය එකඟ වී ඇති අතර එම ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කොට නොමැති බැවින් මෙම මුදල ගෙවීමට නොහැකි විය. |

| | | |
|---|---|---|
| නොතිබුණි. | | |
| (ඉ) 2018 වර්ෂය තුල මූලධන වියදම් සඳහා රු.1,600,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඉන් ප්‍රතිපාදන ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 ක් වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු වීම. | සැලසුම් කරන ලද සමහර මිලදී ගැනීම් සිදු නොකිරිම මීට හේතු විය. |

**2.4** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------------------- |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි 94 (i) හා අංක 01/2014 හා 2014 ජනවාරි 01 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයේ 6.4 වගන්තිය ප්‍රකාර බැරකම් සඳහා බැදීම ඇති කර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන් තුල ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගත යුතු වේ. එහෙත් 2018 වර්ෂය සඳහා එපරිදි කටයුතු නොකර වැය විෂයයන් 03 ක රු.88,723ක් බැරකම්වලට එළඹ තිබුණි. | අදාළ මුදල් රෙගුලාසිය හා චක්‍රලේඛය ප්‍රකාරව බැදීම් ඇති කර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන් තුල ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව බැදිම්වලට එළඹීම. | මෙම දෙපාර්තමේන්තුවේ මුළු පුනරාවර්තන ප්‍රතිපාදන සලකා බැලීමේදී දෙසැම්බර් මස තුළදී විගණන විමසුමේ සඳහන් කරන ලද වියදම් ගෙවීම් සිදු කළේ නම් ඒ සඳහා මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගත හැකිය. ඒ අනුව ප්‍රතිපාදන ප්‍රමාණවත් වන බව දැකිය හැක. |

**2.5** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය<br>------------- | | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම<br>-------------------------- |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව**<br>------------------------ | **අනුකූල නොවීම**<br>------------------- | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික භාණ්ඩ | සමීක්ෂණය භාණ්ඩ සමීක්ෂණ ඉදිරි | වර්ෂයේදි | |

| | | | |
|---|---|---|---|
| සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි මුදල් රෙගුලාසි 756 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.5 ඡේදය. | අවසන් කර ලබාදුන් සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන නිර්දේශ විගණිත දිනය වූ 2018 අප්‍රේල් 19 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | වාර්තාවෙන් දක්වා ඇති නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කඩිනමින් ක්‍රියාකාරි විය යුතු වීම. | චක්‍රලේඛය පරිදි භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නිම කිරීමට සටහන් කර ගතිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඇස්තමේන්තු කිරීමේදී, විධිමත්ව සමාලෝචනය නොකර හා විශ්ලේෂණ නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මුලික ආදායම් ඇස්තමේන්තුව හා වර්ෂය තුළ රැස්කළ සත්‍ය ආදායම් අතර සියයට 20 සිට 2036 ක් දක්වා වාසිදායක විචලනයන් හා සියයට 21 සිට 70 දක්වා අවාසිදායක විචලනයන් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 කෙරෙහි අවධානය යොමුකර නිවැරදිව ආදායම් ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | ඇස්තමේන්තු සකස් කිරීම සඳහා පාදක වූ සාර්ව ආර්ථික උපකල්පනයන් හා එහි සත්‍ය අගයන් අතර විචලනයෙහි බලපෑම, සහ නව ආදායම් බදු පනත සංශෝධනය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවීම වැනි කරුණු තත්‍ය ආදායම අපේක්ෂිත ආදායමෙන් වෙනස් වීමට මූලික වශයෙන් බලපෑ සාධක අතර ප්‍රධාන වේ. |
| (ආ) 2002 ජූලි 17 දිනැති 01/2002 චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව මාසික වාර්තා එළඹෙන මාසයේ 10 වැනි දින හෝ ඊට ප්‍රථම අංක 1 පෝරමය භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතු වුවත් මෙම දෙපාර්තමේන්තුව විසින් රේගු දෙපාර්තමේන්තුවට හා සුරාබදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වාර්තා සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු මාසික වාර්තා අදාල චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම. | සියළුම ආදායම් ගණන්දීමේ නිළධාරින් වෙත ලිපියක් යොමුකර ඇති අතර සුරාබදු දෙපාර්තමේනතුවට අදාලව විමසුමේ දක්වා ඇති හිඟ ආදායම් අයකරගැනීම සම්බන්ධයෙන් මෙතෙක් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව විමසා ඇත. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කර ගනිමින් දෙපාර්තමේන්තුවේ අරමුණු හා දර්ශක හඳුනා ගැනීම හා අරමුණු ළඟා කර ගැනීම සඳහා 2019 වර්ෂය වන විට ද අවශ්‍ය කටයුතු සිදු කර ඇති බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිණි. | ළගා කර ගැනීමට හැකි තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින් අදාල සැලසුම් සකස් කිරීම හා අරමුණු ළගා කර ගැනීමට කටයුතු කිරීම. | 2019 ක්‍රියාකාරි සැලස්ම මඟින් තිරසර සංවර්ධන අරමුණු 3 ක් ඍජුවම ඉටු කිරීමට මෙම දෙපාර්තමේන්තුව මඟින් කටයුතු කෙරේ. |